අංක: ............................................

ලිපිනය: ............................................

1872/2025.

2025/09/10

APC11933

දු: ක: අංකය: 011-2013137.

දිනය: ........................ වේලාව: ..........

විජේතුංග ගමගේ ගයානි මුතුමාලී
අංක 132/ඒ,
ඉඳිගහගොඩැල්ල,
මූලනපාර,
මාකඳුර පාර,
මාතර.

පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

පොලිස්පතිතුමණි,

<u>මාගේ සැමියා වන සමරසිංහ ආරච්චිලාගේ මධුෂ් ලක්ෂිත යන අය පොලිස් අත් අඩංගුවේදී ඝාතනය වීම සම්බන්ධයෙන් වන විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදෙන ලෙස ඉල්ලීම.</u>

මා සමරසිංහ ආරච්චිලාගේ මධුෂ් ලක්ෂිත යන අයගේ නිත්‍යානුකූල බිරිඳ වන අතර ඔහුට පසුගිය කාලයේ ඔහුට විවිධ අපරාධ චෝදනා එල්ලවීමෙන් පසුව විදේශ රටකදී අත් අඩංගුවට ගෙන 2019/05/05 දින සිට අපරාධ පරීක්ෂණ දෙපර්තමෙන්තුවේ (CID) රඳවා තබා තිබුණි. එසේ වසර එකහාමරක පමණ කාලයක් තබා ගැනීමෙන් පසුව 2020/10/16 දින කොළඹ අපරාධ කොට්ඨාශයට (CCD) ඔහුව බාර දී ඇත. එසේ සිටින විට 2020/10/20 දින මාළිගාවත්ත ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය සොයා ගැනීමකට ගෙනයන බව සඳහන් කරමින් ගෙන ගොස් ඇති අතර එහිදී ඔහු වෙඩි වැදීමෙන් මරණයට පත් වී ඇත.

මාගේ ස්වාමිපුරුෂයා මෙසේ සැකකටයුතු ආකාරයට පොලිස් අත්අඩංගුවේදී මියයාම සම්බන්ධයෙන් වත්මන් විදේශ ඇමති විජිත හේරත් මැතිතුමා විසින්ද 2020/10/20 දින පර්ලිමේන්තුවේදී ප්‍රශ්න කර ඇත. (ඒ සම්බන්ධ ගැසට් නිවේදනය මේ සමග ඉදිරිපත් කර සිටිමි) තවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී එවකට බලයේ සිටි දේශපාලඥයන්, පොලිස් නිළධාරීන් සහ පුද්ගලයන් ගණනාවකගේ නම් හෙලි කර ඇති බව මාධ්‍ය මගින් මාහට දැනගන්නට ලැබුණි. එකී අයවලුන් මාගේ සැමියාගේ මරණයට සම්බන්ධ වූවාදැයි මා නොදනිමි. කෙසේ වුවද ඔවුන් සම්බන්ධයෙන් මාහට බරපතල සැකයක් පවතී.

මාගේ සැමියා විසින් අපරාධ සිදු කර ඇත්නම් ඒ සඳහා නීතිය අනුව කටයුතු කරනු ඇතැයි මුල් කාලයේදී මා බලාපොරොත්තුවෙන් සිටියද මෙසේ පොලිස් අත්අඩංගුවේ සිටියදීම ඝාතනය වීම නිසා මටත් මාගේ ආබාධිත දරුවාටත් විශාල මානසික ආතතියක් ඇති වී ඇත. විදේශ ගතව සිටියදී අත්අඩංගුවට ගෙන අපරාධ දෙපාර්තමේන්තුව භාරයේ සිටි වසර එකහමාරක පමණ කාලයේදී

අනාවරණය නොවූ දෙයක් කොළඹ අපරාධ කොට්ඨාශයේ අත්අඩංගුවේ සිටියදී සොයාගත් බවට සඳහන් කරමින් මාළිගාවත්ත ප්‍රදේශයට ගොස් ඔහුව ඝාතනය කිරීම ඉතාමත් අසධාණ සහ අනීතික කටයුත්තක් බව මම ප්‍රකාශ කර සිටිමි, මාගේ සැමියාගේ මරණය යුක්තිසහගත වන්නේ අධිකරණය මගින් මරණීය දණ්ඩනය ලබා දුන්නා නම් පමණි. එය මා හට ඉවසාගත හැකි වුවත් පොලිස් අත්අඩංගුවේදී සැක සහිත ආකාරයට ඝාතනය වීම අයුක්ති සහගත වන අතර එය ඉවසාගත නොහැක.

ඒ අනුව මෙම ඝාතනය සම්බන්ධ විමර්ශනයන්ට තවදුරටත් සිදුවිය හැකි බලපෑම් සහ මෙහි සංකීර්ණ තත්වය මත ඉදිරි අපරාධ විමර්ශන කටයුතු මාළිගාවත්ත පොලිසියෙන් ඉවත් කර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වෙත භාර දෙන ලෙසත් මෙම සිද්ධියේ යුක්තිසහගත භාවය තහවුරු කර ගැනීමට මැදිහත් වන ලෙසත් මා ඉල්ලා සිටිමි.

තවද මෙම ඉල්ලීම මාගේ නීතිඥවරුන් මාර්ගයෙන් ගරු අධිකරණයෙන් ඉල්ලා සිටියත් එහිදී දන්වා ඇත්තේ මෙම ඉල්ලීම පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටින ලෙසයි.

මෙයට,

විජේතුංග ගමගේ ගයානි මුතුමාලී

පිටපත

1. ලේකම් රවී සෙනවිරත්න මැතිතුමා
   මහජන ආරක්ෂක අමාත්‍යංශය

2. සභාපති
   සිරකරු අයිතිවාසිකම් සුරකීමේ කමිටුව

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
ප්‍රායෝගික තත්ත්වය තමයි මම කිව්වේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
PCR පරීක්ෂණ වාර්තා ලබාදීම තවමත් ප්‍රමාද වනවා.

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
ඔබතුමා අමාත්‍යාංශයට කථා කරලා අහන්න.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඕනෑ නම්, මම ඒ සම්බන්ධයෙන් තව උදාහරණ කියන්නම්. ඊයේ වනවිට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරිනියකට කොවිඩ් -19 positive කියලා වාර්තා වුණා. ඇය මැදගම්පිටිය ප්‍රදේශයේ ජීවත් වන කෙනෙක්. මීට දවස් හත අටකට කලින් පරීක්ෂණ කළාම ඇයට කොවිඩ් - 19 negative කිව්වා. ඇය ඊයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩටත් ගිහින් තිබෙනවා. ඊයේ ඇය කොවිඩ් - 19 positive කියලා වාර්තාව ආවා. ඇත්තටම නිවැරදි වාර්තාව ආවේ ඉරිදා හවස. ඒ වාර්තාව එන්න දවස් හතක්, අටක් ගත වුණා. මේ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලු සේවකයන් දැන් අනතුරුදායක තත්ත්වයකට මුහුණ දීලා සිටිනවා. මේක තමයි ඇත්ත තත්ත්වය. ඔබතුමන්ලා උත්සාහ කරනවා ඇති, ඒ වාර්තාව ඉක්මනින් දෙන්න. නමුත් ප්‍රායෝගික තත්ත්වය ඒක නොවෙයි. PCR පරීක්ෂණ වාර්තාව දෙන්න තවමත් දවස් 6ක්, 7ක් ගත වනවා.

එම පරීක්ෂණ වාර්තා ලබාදීම කඩිනම් කළ යුතුයි. එය කඩිනම් කරන්න නම්, ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර හා මානව සම්පත ඉක්මනින්ම සම්පාදනය කළ යුතුයි. මානව සම්පත් සහ යන්ත්‍ර සූත්‍ර, උපකරණ ලබා දෙන්න නම් ඒ උපකරණ ගෙන්වන සැපයුම්කරුවන්ට නිසි වෙලාවට ඒ අදාළ ගෙවීම් කළ යුතුයි. එසේ නොකළ නිසා තමයි මේ අර්බුදයක් පැන නැඟී තිබෙන්නේ. එම උපකරණ ගෙන්වන අයට ඒවා ගෙන්වීමට තිබෙන ඉඩකඩ නැති වෙලා තිබෙනවා. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මුදල් ලැබෙන්නේ නැති නිසා ඒ කටයුත්තේ යම් ප්‍රමාදයක් තිබෙනවා. ඒ කාරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම රජයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තවත් වයිරසයක් මතු වුණා. අද උදෑසන, ප්‍රසිද්ධ පාතාල නායකයකු වූ 'මධුෂ්' මරා දැම්මා. මධුෂ්ව මරා දැමීම නොවෙයි, ජනතාවට තිබෙන ප්‍රශ්නය. ඔහු මරා දැම්මේ ඇයි කියන එක පිළිබඳවයි ජනතාවට ප්‍රශ්නය තිබෙන්නේ. මේක අලුත් දෙයක් නොවෙයි. අපේ රටේ මේ විධියේ ඝාතන සිද්ධ වුණා. ඒ නිසා මේක අලුත් ක්‍රමයක් නං෦෦ාවෙයි. ජනවාරි 28වන දා "නෙත් එෆ්එම්"ගුවන් විදුලි නාළිකාවේ "බැලුම්ගල" කියන වැඩසටහනට මධුෂ් ඩුබායිහි සිට කථා කර තිබුණා, ඒ හඬ පටවල තිබුණා, ඔහුත් එක්ක සම්බන්ධ වූ දේශපාලනඥයන් ගොඩක් ඉන්නවා කියලා. එදා පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයෙක් ප්‍රසිද්ධියේම කිව්වා, අත් අඩංගුවට ගත් මධුෂ් හරහා දේශපාලනඥයන් අසූ දෙනෙකුගේ නම් හෙළිදරව් වෙලා තිබෙන බව. මේ දියවන්නාවේ කුඩු ව්‍යාපාරිකයන් ඉන්නවා කියන එක මධුෂ්ගේ කටින් පිට වුණාය කියන එක වාර්තා වී තිබෙන බව හෙළිදරව් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, your time is up. Please wind up.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අද මධුෂ්ගේ ඝාතනයෙන් පස්සේ මොකද වෙන්නේ? ඒ සියලු කුඩු ව්‍යාපාරිකයන් සහ දේශපාලනඥයන්ගේ නම්, ගම් සැඟවිලා යනවා. ඔහු මරා දැම්මේ ඒකයි. උසාවියට මේ නඩුව ගිහිල්ලා පරීක්ෂණ පැවැත්වුණා නම් -නඩු කටයුතු තිබුණා නම්- ඒ සම්බන්ධතා පැවැත්වූ දේශපාලනඥයන් කවුද කියන එක මධුෂ්ගේ කටින්ම පාපොච්චාරණය වනවා. අද අර සුපුරුදු ක්‍රමවේදය පාවිච්චි කරලා, මධුෂ් ඝාතනය කිරීම හරහා සිදු කළේ ඔහු සමඟ ගනුදෙනු කළ, සම්බන්ධකම් පැවැත් වූ සියලු දේශපාලනඥයන්ගේ නම් ගම් හෙළිදරව් කිරීම නතර කිරීමයි. අන්න ඒක තමයි බරපතළ වැරැද්ද. මේ වැරැද්ද ඉස්සරහටත් වෙන්න ඉඩ තියන්න එපා කියමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Isuru Dodangoda. You have six minutes.

[අ.භා.1.55]

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතට අදාළව අද දිනයේ ඉදිරිපත් කර ඇති නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේදී, අදහස් දක්වන්න මටත් අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

පසුගිය කාල සීමාවේ අපේ රටේ මතු වූ කොවිඩ් - 19 වසංගත තත්ත්වයත් සමඟ රට තුළට ආනයනය කරනු ලබන වෛද්‍ය ශල්‍ය උපකරණ සහ අනිකුත් සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සෙස් බද්දෙන් නිදහස් කරන්නත්, තවත් භාණ්ඩ කිපයක් සඳහා සහන ලබා දෙන්නත් රජය කටයුතු කළා. මම විශේෂයෙන්ම සඳහන් කරනවා, ආනයන සහ අපනයන අතර මනා සම්බන්ධතාවක්, කළමනාකරණයක් පවත්වා ගැනීම රටේ ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යැම සඳහා ඉතාම වැදගත් වන බව. කොවිඩ් - 19 වසංගත තත්ත්වයත් සමඟ රට තුළට ගෙන එන භාණ්ඩ සීමා කිරීමටත්, අත්‍යවශ්‍ය භාණ්ඩ පමණක් රට තුළට ගෙන ඒමටත්, අනවශ්‍ය භාණ්ඩ රට තුළට ගෙන ඒම අඩු කරන්නත් පසුගිය කාලයේ කටයුතු කළ බව තමුන්නාන්සේලා දන්නවා. ඒ තත්ත්වය නිසා, පසුගිය කාල සීමාවේදී දේශීය කර්මාන්තවල ගොඩ නැඟීමක් සිදු වුණා. ඒ වාගේම, දේශීය කර්මාන්ත ගැන ජනතාව තුළ මෙන්ම ඒ කර්මාන්තකරුවන් තුළත් උනන්දුවක් ඇති වුණා. එය යහපත් ලක්ෂණයක්. රට තුළ වගා කළ හැකි භෝග වගා කරලා, ජනතාවට අවශ්‍ය දේ නිපදවිය හැකි තැනට අපේ රටේ ආර්ථිකය ගෙන එන්න මේ අවස්ථාව අපි උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුයි. ඒ තුළින්, විදේශ රටවල් මත යැපීම අඩු කරලා, අපේ රටේ භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරලා, අනාගතයේදී ජනතාවගේ ආර්ථිකයත්, රටේ ආර්ථිකයත් හොඳ තැනකට ගෙන එන්නට හැකියාව ලැබෙයි කියා මා විශ්වාස කරනවා.